**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමන සේවා ගණයේ (RS-02 ) ප්‍රධාන සුරාබදු පරීක්ෂක/සුරාබදු පරීක්ෂක නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය**

01.හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009/02/20 දිනැති අංක 1588/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පරිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන අනුව සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සුරාබදු පරීක්ෂක/ සුරාබදු පරීක්ෂක නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය

**02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධාරීන් පිළිබඳ විස්තර:**

2.1 මේ වන විට සේවයේ යෙදී සිටින ප්‍රධාන සුරාබදු පරීක්ෂක හා සුරාබදු පරීක්ෂක නිලධරයන්

2.2 එක් එක් සේවා ස්ථාන වල සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේද

1. එක් සුරාබදු ස්ථානයක උපරිම සේවා කාලය වසර (03) තුනක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්.
2. සියළුම ස්කාගාර, නිෂ්පාදනාගාර සහ ගුදම්වල උපරිම සේවා කාලය එක් ස්ථානයක වසර (01) එකක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්.
3. ප්‍රධාන කාර්යාලයේ උපරිම සේවා කාලය වසර (03) තුනක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්.
4. විශේෂ මෙහෙයුම් ඒකකවල උපරිම සේවා කාලය වසර (03) තුනක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්.
5. මත්ද්‍රව්‍ය නාශක අංශයේ උපරිම සේවා කාලය වසර 03(තුනක්) සම්පූර්ණ කර ඇති නිලධාරීන්

2 .3 ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල උපරිම සේවා කාලය වසර 03 (තුනක්) සම්පූර්ණ කර ඇති නිලධාරීන්, සියළුම ස්කාගාර, නිෂ්පාදනාගාර සහ ගුදම්වල සේවය කරන නිලධාරීන් වසර 01 සම්පූර්ණ වූ පසු ස්ථානමාරු ඉල්ලුම් කළ යුතු අතර, අනෙකුත් සේවා ස්ථානවල නිලධාරීන් ද වසර 03 ක් සම්පූර්ණ වූ පසු අනිවාර්ය ස්ථාන මාරුවීම්වලට යටත් වේ. එසේ වුවත් ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල වසර 2 1/2 ක සේවා කාලයක් සම්පූර්ණ වූ නිලධාරීන්ද ස්ථානමාරු ඉල්ලුම් කළ යුතුය.

2.4 උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවන් හැර උතුරු පළාතේ සේවය කරනු ලබන අනිකුත් නිලධාරීන් තම කැමැත්ත මත වසරකින් ස්ථානමාරුවක් සඳහා ඉල්ලුම් කළ හැකිය. එහෙත් එම නිලධාරියා කැමතිනම් ඉදිරි වසර 2 හෝ වසරක් සඳහා සේවය කරන සුරාබදු ස්ථානය හෝ නිෂ්පාදනාගාරයක් හෝ වෙනත් සුරාබදු ස්ථානයක් ඉල්ලුම් කළ හැකිය. තවද එවැනි නිලධාරීන් සඳහා, ඔවුන් උතුරු පළාතේ සේවය කරන ස්ථාන, සේවා ස්ථාන වර්ගීකරණය අනුව එක් ස්ථානයක් පහළ දමා ඒ අනුව ලකුණු ගණනය කළ යුතුය. ( උදා:- B2 ස්ථානයක සේවය කරන්නේ නම් B3 ස්ථානයකට අදාල ලකුණු ගණනය කළ යුතුය.)

**2.5 සේවා ස්ථාන වර්ගීකරණය**

**( සේවා ස්ථාන වර්ගීකරණය ඇමුණුම් 01 හි දැක්වේ.)**

<u>A - ඉතා ප්‍රියමනාප (45 - 100 දක්වා )</u>
A 1 – 100
A 2 – 50
A 3 - 45

B – (ප්‍රියමනාප ( 25 -35 දක්වා)
B 1 - 35
B 2 - 30
B 3 - 25

Page No. 1 / RS-02

C – (ප්‍රියමනාප නොවන (5 -15 දක්වා)
C1 - 15
C2 - 10
C3 – 05